# උගත් තරුණයින්ගේ ගොවිපල

රචනය — **එස්. එන්. දිසානායක**

**හැඳින්වීම.** උගත් දක්ෂ තරුණයින් එකොලොස් දෙනෙක් මාතර රජයේ ඉඩම් අක්කර 22ක පදිංචි වී සමුපකාර ක්‍රමයට නවීන ගොවිතැන් ක්‍රම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි සාර්ථක ලෙස උදෙහාගයෙන් කරගෙන යති. ඉඩම් කොමසාරිස් වරයා විසින් පිළිගත් වැඩ පිළිවෙලක් අනුව රජයේ ඉඩම් වල පදිංචි කරණ ලද මොවුන්ට රජයෙන් මෙන්ම, ආසියා පදනමෙන්ද විශාල ආධාර ප්‍රමාණයක් ලැබී ඇති බැවින් මොව්හු රටේ අනික් ගොවීන්ට නොදෙන ලද ඉමහත් වරප්‍රසාද ලැබූ වාසනාවන්තයෝ ය. පළමුවෙන්ම ජ්‍යෙෂ්ඨය දක්වා උගත් මෙම තරුණයින් "ලංකාවේ අනාගත ගොවියන්" යන සංවිධානය යටතේ සංවිධානය වූ නමුදු පසුව ඔවුන්ගේ වැඩ කටයුතු රජය මගින් පවරා ගන්නා ලදී.

**අරමුණ.** ලංකාවේ උගත් තරුණයින් අතර සතුන් ඇති කිරීම හා කෘෂිකර්මය වැනි විෂයයන් පිළිබඳ විවිධ ගොවිතැන් ක්‍රම පිළිබඳව උනන්දුවක් හා ලැදියාවක් ඇති කිරීම මෙම අරමුණ සාර්ථක ලෙස ඉටු කර ගැනීම හා ඒ සඳහා විදේශීය කෘෂි විද්‍යාඥයින්ගේද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේද, ලංකාවේ සිටින දක්ෂ ධෛර්යවන්ත ගොවියන්ගේ ද ආධාර හා උපදෙස් මොවුහු ප්‍රයෝජනයට ගනිති. මෙම ව්‍යාපාරය මනා ලෙස පැළපැදියම් වී සාර්ථක වූ පසු එහි අදහස වනුයේ තව තවත් සාමාජිකයන් බඳවා ගෙන වැඩි තරුණයින් ගණනකට රැකියාවන් සපයා දීමයි. තවද ව්‍යාපාරය මනා ලෙස සංවර්ධනය වූ පසු පාසැල් වලින් අස්වන සිසුන් තුළ ශ්‍රමය වියදම්කොට එළිමහනේ කරණ වැඩ කටයුතු පිළිබඳව අභිමානයක් ඇති කිරීම හා උගත් තරුණයින්ට රැකියාවන් සොයා ගැනීමට නුපුළුවන් වීම නිසා ඇති වන මන්දෝත්සාහී කල කිරීම තුරන් කොට ඔවුන්ට මෙවැනි නිවහල් රැකියාවන් සොයා දීමද මෙහි අරමුණයි.

තවද ලංකාවේ නියම රැකියාවක් නොමැති අය අවුරුද්දකට හැටපන් දහසකින් (65,000) පමණ වැඩි වන බැවින් සමාජයේ දක්ෂ උගතුන් අතර ඇති වන මන්දෝත්සාහී කල කිරීම වලක්වා ගොවිතැන තමනට නොවේ යයි දැනට සිතා සිටින උගතුන් ගොවිතැනට යොමු කිරීමද මෙහි එක් අරමුණකි.

**ආධාර.** ආසියා පදනම මගින් පළමුවෙනි මුදල් වර්ෂය සඳහා මෙම ගොවියන්ගේ නවීන ගොවි කටයුතු දියුණු කිරීමට රු. 30,000 ක මුදලක් කච්චේරියේ තැන්පත් කරණ ලදී. තවද එමගින්ම ජල පොම්පයක් හා ජල නළද කුඩා අත් ට්‍රැක්ටරයක් හා ඊට සම්බන්ධිත ට්‍රේලරයක් හා ගොවි උපකරණද ලබා දෙන ලදී. "කෙයාර්" සංවිධානය මගින් ගඩොල් සාදන යන්ත්‍රයක් ලබා දෙන ලද අතර එම ආයතනය මගින්ම වඩු වැඩට උපකරණ හා ප්‍රථමාධාර පෙට්ටියක්ද ලබා දෙන ලදී. රජය විසින් මේ උසස් වැඩ පිළිවෙල සඳහා රු. 65,000 ක මුදලක් ආධාර වශයෙන් ලබා දෙන බැවින් එක් තරුණයෙකුට රු. 6,000 ක් පමණ මේ අනුව ලැබේ. තවද රජයෙන් මසකට එක් අයෙකුට රු. 45 බැගින් අවුරුදු තුනකට යැපීම් දීමනාවක්ද නොකඩවා ලබා දෙනු ඇත. තවද රජය මෙම පුරෝගාමී තරුණ ගොවියන්ට අවශ්‍ය ඇඳුම් (දිග කලිසම් හා කමිස) හා සපත්තුද නොමිලයේම සපයන අතර එක් ගොවියෙකුට රුපියල් 75 බැගින් කටු කම්බි ලබා ගැනීම සඳහා ආධාර මුදලක්ද වගා ආධාරයක් වශයෙන් රුපියල් 65 ක්ද ලබා දෙන ලදී. දෙවන අවුරුද්ද අවසානයේදී රජය මගින් එක් එක් තරුණයාට නිවාසය බැගින් එක් නිවසකට රුපියල් 20,000 බැගින් වියදම් කොට මෙවැනි ආදර්ශමත් ගොවීන්ට අවශ්‍ය නිවාස තනා දෙනු ඇත. තවද නෙදර්ලන්ත රජය මගින් ට්‍රැක්ටර් යන්ත්‍රයක් හා ට්‍රේලර් යන්ත්‍රයක් හා සම්බන්ධිත උපකරණද නොමිලයේ ම මෙම ගොවියන්ට ප්‍රදානය කරණ ලදී. මෙම

ට්‍රැක්ටරය සඳහා අවශ්‍ය වන ඉන්ධන ඉඩම් කොමසාරිස්ගේ වැය ශීර්ෂයෙන් ගෙවනු ලැබේ.

**ගොවි වැඩ.** මෙම ගොවිපළේ ගොවි වැඩ අරඹන ලද්දේ 1965 ඔක්තෝබර් මස 22 වැනි දාය. දැනට අවුරුද්දක් ගත වී ඇති මෙම ගොවි පලේ දෙමුහුන් කිකිළියන් 2000 ක් පමණ ඇති අතර මෙම ගොවියන්ට දිනකට වැඩුණු සම්පූර්ණ කිකිළියන් 400 දෙනෙකුගෙන් බිත්තර 300ක් පමණ ලැබේ. 1967 පෙබරවාරි වන විට දැනට නොවැඩුණු මට්ටමක ඇති කිකිළියන් වැඩුණු විට දිනකට බිත්තර 15,000 ක් පමණ ලැබේ යයි අපේක්ෂා කෙරේ.

මෙම ගොවිපලේ දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් දෙන ලද ජම්නාපාරි එළුවන් 32ක් ඇති කරණ අතර සානන් පුං එලුවෙක් ද පට්ටි ගැස්සීම සඳහා ඇති කරනු ලැබේ. තවද මෙහි පට්ටි ගැස්සවීම සඳහා ඌරෙක් ද ඊරි පැටවුන් 10 ක් ද සාර්ථක ලෙස ඇති කරනු ලැබේ.

අප මෙම ගොවිපළට යන විට තරුණයින් 11 දෙනා ගඩොල් සෑදීමේ නිරත වී සිටියහ. මෙම තරුණයින් ගඩොල් සාදනු ලබන්නේ ගම්බද අය ගඩොල් සාදන ක්‍රමයට නොවේ. කෙයාර් සංවිධානය මගින් මෙම ගොවියන් වෙත ප්‍රදානය කරණ ලද ගඩොල් සෑදීමේ විශේෂ උපකරණයක් මගින් මෙම ගඩොල් සාදනු ලැබේ. සිමෙන්ති කොටස් එකකට පස් කොටස් 14 ක් කලවම් කිරීමෙන් සාදනු ලබන මෙම ගඩොල් 350ක් සාමාන්‍ය පුච්චන ලද ගඩොල් 1000කට සමාන වෙයි. මෙම ගඩොලක් සෑදීමට ශත=03 ක් පමණ වන ඉතා අඩු මුදල් ප්‍රමාණයක් වියදම් වන අතර එක ගඩොලක් ශත 05 සිට 10 දක්වා මුදලකට අලෙවි කළ හැක. මෙම ගොවිපළේ වියහියදම් සමූපකාර නිලධාරීන් විසින් මසකට වරක් පරීක්ෂා කරති.

**අනාගත සැලැස්ම.** ලංකාවේ දැනට මෙවැනි තරුණ ව්‍යාපාර 27 ක් ඉඩම් අමාත්‍යාංශය මගින් අරඹා ඇති අතර මිශ්‍ර ගොවිතැන් ක්‍රමයක් ක්‍රියාවේ යොදන්නේ මාතර දිස්ත්‍රික්කයේ කැකණදුර පිහිටි මෙම ගොවිපළේ පමණය. “ලංකාවේ අනාගත ගොවියන්” යන මෙම සංවිධානයේ පළමුවැනි පියවරේ සංවර්ධන වැඩ පිළිවෙලේ සතුන් ඇති කිරීම සංවිධානය කිරීමට බලාපොරොත්තු වන්නේ මෙසේය. අක්කර 4 හමාරක වපසරියේ කිකිළියන් 6,000 ක් ඇති කිරීම. අක්කර 5 ක එළදෙනුන් 10 ක් ඇති කිරීම. අක්කර 1 හමාරක ඌරන් 670 ක් ඇති කිරීම. අක්කර භාගයක වපසරියේ කළුකුන් 100 ක් ඇති කිරීම, අක්කර භාගයක තාරාවන් හා පාත්තයන් 1000 ක් ඇති කිරීම.

පළතුරු වගා කිරීමේ වැඩ පිළිවෙල අනුව අක්කර දෙකක අඹ පැළ 300 ක්ද, අක්කර දෙකක දොඩම් පැළ 400 ක්ද, අක්කර දෙකක මැන්ගුස්ටින් පැළ 300 ක්ද, අක්කර දෙකක වැල් දොඩම් වැල් 1260 ක්ද, අක්කර 3 ක කෙසෙල් පඳුරු 600 ක්ද අක්කර 2 හමාරක අන්නාසි කුරුල්ලන් 30,000 ක් ද, අක්කර භාගයක වපසරියේ පැපොල් පේර හා රඹුටන් අක්කර භාගයක්ද, අක්කර දෙකක වපසරියේ පහතරට එළවළු වගා කිරීමටද පාලකයෝ බලාපොරොත්තු වෙති.

**අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා ගොවි උපකරණ**

මෙම ගොවිපළට පහත සඳහන් යන්ත්‍රෝපකරණ හා ගොවි උපකරණ අවශ්‍ය වේයයි පාලක මණ්ඩලය බලාපොරොත්තු වෙති. බිත්තර 10,000 ක් රක්කවිය හැකි රක්කනයක් විදුලි බලයෙන් ක්‍රියා කරණ බිත්තර පරීක්ෂා කිරීමේ පහනක්, ස්වයංකාරී බිත්තර වර්ග කිරීමේ උපකරණයක්, බිත්තර පිරිසිදු කිරීමේ උපකරණයක්, විදුලි බලයෙන් ක්‍රියා කරණ පැටවුන් ඇති දැඩි කිරීමට අවශ්‍ය බ්‍රූඩර් පහක් (එක් බ්‍රූඩරයක පැටවුන් 500ක් ඇති දැඩි කළ හැකි විය යුතුය.) විදුලි බලයෙන් ක්‍රියා කරණ පැටවුන්ගේ ලිංග වෙන් කිරීමේ යන්ත්‍රයක්, බිත්තර 75,000ක් ප්‍රවාහනය කිරීම හැකි බිත්තර දමන ට්‍රේ, බිත්තර 5,000ක් අඩංගු කළ හැකි ප්ලාස්ටික් හෝ කම්බි වලින් සෑදූ බිත්තර පෙට්ටි, කිරි දෙවීමේ යන්ත්‍රයක් කුණු ගෙන යන ට්‍රක් එකක්, ජීප් රථයක්,වැගන් රථයක්, අතින් ක්‍රියා කරවිය හැකි බෙහෙත් ඉසින යන්ත්‍ර දහයක්, කිලෝවෝට් 10ක බලය ඇති විදුලි බලය නිපදවන යන්ත්‍රයක් පැයකට ජලය ගැලොම් 5,000ක් පොම්ප කළ හැකි ජල පොම්පයක් ආදිය වෙයි.



3—එච් 135 (66/10)

**ආදායම්.** මෙම ගොවිපලේ කුකුළු ව්‍යාපාර යෙන් පාලකයෝ ආදායම් ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ මෙසේය: ශත 20 බැගින් බිත්තර 1,728,000කට රුපියල් 3,45,600.00යි. මස් සඳහා එකෙක් රු. 4 බැගින් පණපිටින් සතුන් 5,000 රුපියල් 20,000.00.

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| මුළු ආදායම | ... | ... | 3,65,600 | 0 |
| මුළු වියදම | ... | ... | 2,45,500 | 0 |
| බලාපොරොත්තු වන ආදායම | | ... | 1,20,100 | 0 |

මෙම ගොවිපලේ ඌරන් ඇති කිරීමට මුදල් වියදම් කිරීමට බලාපොරොත්තු වන අයුරු පහතින් පෙනේ.

පව්ටි ඌරන් 2කුට පැටවුන් බලාපොරොත්තු ඊරියන් 20 කුට වියදම එකෙකුට රු. 300 බැගින් රු. 6,600.00යි. ඊරියන් 20 දෙනාට හා පව්ටි ඌරන් දෙදෙනාට ආහාර අවුරුද්දකට රු. 1,900.00යි. විකිණීමට සුදුසු වන තෙක් ඌරු පැටවුන් 230කට කෑම වියදම රු. 27,200.00යි. තුන් මසකට ඌරු පැටවුන් 640කට ආහාර (පලමුවැනි අවුරුද්දේ අවසාන) රු. 8,900.00යි. බෙහෙත් රු. 500.00, ඌරන්ට නිවාස රු. 10,000.00 (මූලධන) මුළු එකතුව රු. 45,100.00

**ඌරු කොටුවේ ආදායම**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඊරියන් 20දෙනෙක් හා පව්ටි ඌරන් 2නා රා. 6,000ක් බර රාත්තල රු. 1 බැගින් | | 6,600 | 0 |
| රා. (200''ක් බර) ඌරු පැටවුන් 230ක් රාත්තල රු. 1 බැගින්... | ... | 46,000 | 0 |
| තුන් මස් වයසැති ඌරු පැටවුන් 640 පැටවෙක් රු. 30 බැගින් ... | ... | 19,200 | 0 |
| මුළු ආදායම ... | ... | 71,800 | 0 |
| පළමුවන අවුරුද්දේ ආදායම | ... | 71,800 | 0 |
| පළමුවන අවුරුද්දේ වියදම | ... | 45,100 | 0 |
| සම්පූර්ණ ආදායම | ... | 26,700 | 0 |

**අවසානය.** මෙරට ආහාර අවශ්‍ය පමණ සුලභ කිරීමට නම් ඉහත කී අන්දමේ ක්‍රමානුකූල නවීන ක්‍රමයට පිළිවෙලකට උද්යෝගිමත්ව වැඩ කරන ගොවිපලවල් අප රටට අවශ්‍යය. එහෙත් මෙවැනි ක්‍රමාණුකූල ගොවිපලවල් ඇති කිරීම පහසු කාරියක් නොවේ. පරම්පරා ගත චාරිත්‍රාණුකූල ගොවි ක්‍රම වලට වෙනස් වූ මෙවැනි ගොවි කටයුතු බහුල වශයෙන් ඇති කළොත් රටේ සමාජයීය පරිවර්තනයක් ඇති වී ආහාර වර්ග නිපදවීමට වඩාත් කාර්යක්ෂම වාතාවරණයක් රට තුළ ඇති වනු ඇත.

**නිමි**


## නව සහතික මිල

හොන්ඩරයක්:— මිරිස් 1 වෙනි වර්ගය – රු. 252.00
මිරිස් 2 වෙනි වර්ගය – රු. 196.00
මිරිස් බාල වර්ගය – රු. 112.00

රටඑතු හොන්ඩරයක් – රු. 35.84

## සියළුම පාඨකයින් වෙත දන්වීමයි

1967 ජනවාරි මාසයේ සිට ගොවිකම් සඟරාව විකුණන මිළ ශත තිහකි. එහෙත් අවුරුද්දක දායක මුදල වන රුපියලක් ගෙවා දායක වන දායකයින්ට එහි වටිනාකමට කලාප හතරක් ලබා ගැනීමේ වාසිය තවදුරටත් ලැබෙනවා ඇත. මෙතෙක් ඔබ රුපියලක් ගෙවා දායකත්වය ලබා ගෙන නොමැතිනම් ඔබේ ගොවිකම් සඟරා පිටපත් ඉක්මනින් කෘෂිකර්ම නිලධාරි (ව්‍යාප්ති ආධාර) තැ. පෙ. 636, කොළඹ 12 නමැති ලිපිනයට හෝ ඔබට ළඟම ඇති කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශකතැනට හෝ තැපැල් ඇණවුමක් හෝ මුදල් ඇණවුමක් එවීමෙන් ලබා ගන්න.

කෘෂිකර්ම නිලධාරි (ව්‍යාප්ති ආධාර) නමට ඔබේ නම, ගම හා ලිපිනය ඇතුළත් ලිපියක් සමඟ දායක මුදල ලැබෙන්නට සැලැස්සුවහොත් ගොවිකම් සඟරාව ඔබේ නමට කෙළින්ම තැපැල් කරනු ලැබේ. එමෙන්ම ඔබේ දායක මුදල කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක වෙත ලැබෙන්න සැලැස්සුවහොත් ඔබේ ගොවිකම් සඟරාව කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන් ඔබට ලබා ගැනීමට පුළුවන් වන සේ ව්‍යාප්ති මධ්‍යස්ථානයට තැපැල් කරනු ලැබේ.

**නැගෙනහිර ලෝකයේ ඇති ඉතාමත්ම ජනප්‍රිය හා**

**ලාබදායී සඟරාව ගොවිකම් සඟරාවයි**

## ඔබේ පිටපත අදම වෙන් කරවා ගන්න